# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 09/2022

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2022.05.05

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

## ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සඳහා වන විධිවිධාන

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සඳහා වන විධිවිධාන පිළිබඳ 1995 ඔක්තෝබර් 05 දිනැති අංක 649 දරන කොමිෂන් සභා චක්‍රලේඛය වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2022 ජනවාරි 27 දින පැවති සිය 1071 සභාවාරයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයන් සලකා බැලීමෙන් අනතුරුව, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649-ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සඳහා වන විධිවිධාන සංශෝධනය කිරීමටත්, ඒ අනුව පහත දැක්වෙන නව වත්කම් කාණ්ඩ සහ ක්ෂයවීම් අනුපාත එක් කිරීමටත් අනුමැතිය ලබා දෙන ලදී.

### ස්ථාවර වත්කම් කාණ්ඩ සහ ක්ෂය අනුපාත

| ස්ථාවර වත්කම් කාණ්ඩ | | ක්ෂය අනුපාත (වසරකට) |
|---|---|---|
| 1812 | පරිගණක උපකරණ / උපාංග | 20% |
| 1813 | පරිගණක මෘදුකාංග | 20% |
| 1814 | ජනක යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධතිය | 10% |
| 1815 | කාණු සහ මලාපවහන පද්ධතිය | 10% |
| 1816 | ක්‍රීඩා භාණ්ඩ / උපකරණ | 25% |

3. ඉහත නව වත්කම් කාණ්ඩ සහ ක්ෂයවීම් අනුපාත 2022.05.10 දින සිට බලපැවැත්වෙන අතර කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 හි අනෙකුත් නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

4. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ. කළේ :- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති

පිටපත් 1. ලේකම්/ අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. අභ්‍යන්තර විගණක/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. විගණකාධිපති
13. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්

ලිපි ගොනු අංක: යූජීසී/ සීඅයිඒ/ එෆ්/අයිඒ චක්‍ර./1